# IBAC ගැන

www.ibac.vic.gov.au

Sinhalese

රාජ්‍ය අංශයේ සේවයේ නිරත අය සහ පොලිස් නිලධාරීන්, තම පුද්ගලික ප්‍රයෝජන වලින්, ගිජුකමෙන් හෝ සාපරාධී චේතනා වල බලපෑමෙන් තොරව, ඔබේ යහපත උදෙසා කටයුතු කරණු ඇතැයි අපේක්ෂා කිරීමට ඔබට අයිතියක් තිබේ. රාජ්‍ය අංශය කෙරෙහි ඔබ තුල ඇති විශ්වාසය ආරක්ෂා කිරීම පිණිස, මහජන මුදල් නාස්ති කරන සහ ජීවිත හානි කරන දූෂිත ක්‍රියා සහ අවකල්ක්‍රියා වැලැක්වීමට සහ එළිදරව් කිරීමට IBAC කටයුතු කරයි.

## IBAC වික්ටෝරියාවේ දූෂණ විරෝධී ආයතනයයි

IBAC හි දැක්ම වනුයේ සක්‍රීය ලෙස දූෂණයට විරෝධය දක්වන රාජ්‍ය සේවයක් ඇති කිරීමයි.

අප මෙම කාර්යය කරන්නේ පහත ආකාරයටයඃ

1. රාජ්‍ය අංශයේ දූෂණ සහ අවකල්ක්‍රියා (පොලිසියේ අවකල්ක්‍රියා සහ රජයේ කාර් යාලවල අවකල්ක්‍රියා ඇතුලුව) පිළිබඳව දැන්වීම් සහ පැමිණිලි ලබා ගැනීම
2. බරපතල සහ ව්‍යුහාත්මක කරුණු වලට ප්‍රමුඛත්වය දෙමින්, දූෂණ සහ අවකල්ක්‍රියා විභාග කිරීම සහ එළිදරව් කිරීම
3. දූෂණ සහ අවකල්ක්‍රියා වල අවදානම් සහ ප්‍රතිඵලද, ඒවා වළක්වා ගැනීමට ඇති මාර්ග ගැනද රාජ්‍ය අංශය,ප්‍රජාව සහ පොලිසිය දැනුවත් කිරීම.

## 1. දූෂණ ගැන පැමිණිලි කිරීම

සෑම වසරකම රාජ්‍ය අංශයේ දූෂණ සහ අවකල්ක්‍රියා ගැන චෝදනා 5000 ක් පමන IBAC වෙත ලැබේ. රාජ්‍ය අංශය පුරා දූෂණ එළිදරව් කිරීමට සහ මතුවන ප්‍රවනතා සහ අවදානම් හඳුනාගැනීම සඳහා මෙම තොරතුරු ඉතා වැදගත් වේ.

IBAC විසින් සියලුම පැමිණිලි, ඒවායේ අඩංගු තොරතුරු අපේ පර්යේෂණ, අනෙකුත් පැමිණිලි සහ බුද්ධි සම්භාර සමග හරස් අවේක්ෂණය කර, ප්‍රවේසමෙන් ඇගයුම් කරනු ලැබේ. ඉන් පසු පහත පරිදි අපි තීරණය කරන්නෙමුඃ

- වික්ටෝරියානු ඔම්බඩ්ස්මන් (Victorian Ombudsman), වික්ටෝරියානු ෙපාලීසිය (Victoria Police) හෝ චෝදනාවට ලක්වූ ආයතනයට **පැමිණිල්ල යොමු කිරීම**. මෙම කරුණු මුළුමනින්ම විභාගකර ඇතැයිද, ඒ ගැන නිසි පරිදි කටයුතු කර ඇතැයිද යන්න සහතික කරගැනීම පිණිස, ඒවායේ ප්‍රතිඵල IBAC විසින් නිතර සමාලෝචනය කරනු ලැබේ.
- අප විසින්ම පැමිණිල්ල **විභාග කිරීම**. මෙම තීරණය ගැනීම සඳහා IBAC විසින් මූලික විමසීමක් පැවැත්වීමට ඉඩ තිබේ.
- **වැඩිදුර ක්‍රියාමාර්ගයක් නොගැනීමට.**

**IBAC හි අධිකරණ වසම - වික්ටෝරියානු රාජ්‍ය සේවය**



### ප්‍රාන්ත රජය

- දෙපාර්තමේන්තු
- ආයතන/කාර්යාල
- පොදු සෞඛ්‍යසත්කාර සේවා
- පාසල්
- TAFE සහ විශ්ව විද්‍යාල



### කවුන්සල

- කවුන්සල සභිකයෝ
- කවුන්සල කාර්ය මණ්ඩල



### වික්ටෝරියානු පොලීසිය

- දිවුරුම් ලත් පොලිස් නිලධාරීන්
- ආරක්ෂක සේවා නිලධාරීන් (Protective services officers (PSOs))
- පොලිස් සේවයට අළුතෙන් බඳවා ගත් අය
- පොලිස් අත්අඩංගු නිලධාරීන්
- සේවකයන්



### පාර්ලිමේන්තුව

- පාර්ලිමේන්තු මන්ත්‍රී වරු
- ඡන්ද දායක කොට්ඨාස නිලධාරීන්
- අමාත්‍ය කාර්ය මණ්ඩල



### අධිකරණය

විනිශ්චයකරුවෝ, මහේස්ත්‍රාත් වරු සහ පහත ඇතුලත් වෙනත් අධිකරණ ආයතන වල සාමාජිකයන්ඃ

- ශ්‍රේෂ්ඨාධිකරණය
- කෝරළ උසාවිය (County Court)
- හදිසි මරණ පරීක්ෂක උසාවිය
- මහේස්ත්‍රාත් උසාවිය
- VCAT

### රාජ්‍ය අංශයේ දූෂණය යනු කුමක්ද?

දූෂණය යනු රාජ්‍ය අංශයේ සේවකයෙක් විසින්, වංචා සිදු කිරීම, අල්ලස් ලබා ගැනීම හෝ දීම, පවුලේ අයට හෝ මිතුරන්ට කොන්තරාත්තු පිරිනැමීම, සහ පුද්ගලික වාසි සඳහා වරප්‍රසාද යටතේ ලබාගත් තොරතුරු පිට කිරීම හෝ පාවිච්චි කිරීම විය හැකිය.

### රජයේ තනතුරු වල අවකල්ක්‍රියාව යනු කුමක්ද?

රජයේ සේවකයකුගේ නීති විරෝධී හෝ රාජකාරි කටයුතු වලදී හෝ තමන්ට පැවරී ඇති බලතල පාවිච්චි කිරීමේදී පිළිපැදිය යුතු ආචාරධර්මීය හෝ වෘත්තීය සම්මතයන් ආරක්ෂා නොවන ආකාරයේ ඕනෑම ක්‍රියාවක් රජයේ තනතුරු වල අවකල්ක්‍රියාවක් විය හැකිය.

### පොලිස් අවකල්ක්‍රියාව යනු කුමක්ද?

දිවුරුම් ලත් නිලධාරීන්, සේවයට අළුතෙන් බඳාවා ගත් අය, සේවකයන් සහ PSOs ඇතුලු වික්ටෝරියානු පොලිස් සේවක මඩුල්ලේ පුළුල් අවකල්ක්‍රියා ගැන පැමිණිලිද IBAC විසින් ලබා ගනු ලැබේ.

අවකල්ක්‍රියාව යනු පොලිස් සේවකයෙකු විසින් අහිතකර කරුණු බෙදා හැරීම, වෙරි මතින් රිය පැදවීම, ලොග් පොතක/නාමලේඛනයක අසත්‍ය තොරතුරු ඇතුලත් කිරීම හෝ අධික බලය පාවිච්චි කිරීම විය හැකිය.

## 2. දූෂණය විභාග කිරීම

රාජ්‍ය අංශයේ බරපතල සහ ව්‍යුහාත්මක දූෂණ සහ අවකල්ක්‍රියා විභාග කිරීම සඳහා ප්‍රමුඛත්වය දීමට IBAC නීතියෙන් බැඳී සිටී. පැමිණිල්ලක් හෝ දන්වා සිටීමක් විභාග කිරීමයට හෝ තම උවමනාවෙන්ම විභාගයක් පැවැත්වීමට IBAC හට තෝරා ගැනීමට පුළුවන.

අපගේ විභාග මගින් දූෂණ ක්‍රියාවක් හෝ පොලිස් අවකල්ක්‍රියාවක් සිදුවී ඇත්ද යන්න නිශ්චය කරනු ලැබේ. අපරාධ චෝදනා නිකුත් කිරීම හෝ වැඩිදුර ක්‍රියා සඳහා නිර්දේශ කිරීම සිදුවිය හැකි සාමාන්‍ය ප්‍රතිඵලයන්ය. අප වාර්තා ප්‍රකාශයට පත් කිරීමටත්, පද්ධති හෝ පරිචය දියුණු කිරීමේ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පුළුවන.

### විභාග පැවැත්වීම

විභාගයන් IBAC හි විමර්ශන ක්‍රියාවලියේ කොටසක් වන අතර සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ පෞද්ගලිකවය. පහත හේතු මත අපේ කොමසාරිස්වරයා පොදු නඩු ඇසීම් පැවැත්වීමට ඉඩ ඇත:

- විශේෂිත කරුණු සහිත වුවිට
- පොදු යහපත සඳහා
- පුද්ගලයෙකුගේ කීර්තියට, ආරක්ෂාවට හෝ සුභ සිද්ධියට අසාධාරන හානි සිදු නොවන සේ එය පැවැත්වීමට හැකි විට.

### IBAC බලතල වගකීමෙන් යුතුව පාවිච්චි කිරීම

විභාගයකදී IBAC විසින් පහත දේවල් කල හැකිය:

- ලියකියවිලි සහ දේවල් ඉදිරිපත් කරන ලෙස බල කිරීම
- පරිශ්‍රයන්ට ඇතුල් වීම, පිරික්සා බැලීම, ලියකියවිලි සහ දේවල් භාරයට ගැනීම
- ආවේක්ෂණ උපකරන පාවිච්චි කිරීම, විදුලි සංදේශ අල්ලා ගැනීම
- පුද්ගලික හෝ පොදු විභාග පැවැත්වීම
- විභාග වලදී සාක්කි දෙන ලෙස පුද්ගලයන්ට නියම කිරීම.

මේ සමහරක් බලතල පාවිච්චි කිරීමට පෙර IBAC විසින් ඒ සඳහා අධිකරණයේ අවසර ඉල්ලුම් කර සිටිය යුතුය. අපගේ බලතල පාවිච්චිය ගැන විවිධ ප්‍රාන්ත සහ මධ්‍යම ආණ්ඩු ආයතන වලට අප විසින් නිතිපතා වාර්තා කරනු ලැබේ.

## 3. දූෂණය වැළැක්වීම

රාජ්‍ය අංශයේ දූෂණය වැලැක්වීමටත්, වැදගත් රාජ්‍ය සේවා සහ යටිතල සියලු වික්ටෝරියානුවන්ටම සපයමින් ,අපේක්ෂිත අන්දමට මහජන මුදල් වියදම් කරන බව සහතික කිරීමටත් අපි සැමදෙනාටම වගකීමක් තිබේ.

රාජ්‍ය අංශයේ දූෂණය සහ බරපතල අවකල්ක්‍රියා වැලැක්වීම, මුළු IBAC ආයතනයම සම්මාදම් වන මූලික ප්‍රමුඛතාවයකි.

පහත පෙනෙන අරමුණු පිණිස, අවංකභාවය පිළිබඳ ප්‍රාන්ත පද්ධතියේ ප්‍රධාන හවුල්කරුවන්ද එක්ව, IBAC විසින් පුළුල් පරාසයක වැලැක්වීමේ මැදිහත්වීම් සමුදායක් නිර්මාණය සහ සැපයීම කරනු ලැබේ:

- දූෂණය සහ බරපතල අවකල්ක්‍රියා හඳුනාගැනීමට සහ වාර්තා කිරීමට පුද්ගලයන් බලායනය කිරීම
- ඵලදායී දූෂණ සහ අවකල්ක්‍රියා පාලනක්‍රම ගොඩනගා ගැනීමට සංවිධාන වලට ආධාර කිරීම
- ශක්තිමත් සහ කල්පවත්නා දූෂණ විරෝධී සංස්කෘතියක් නිමකිරීමට සාමාජයීය ප්‍රතිමාන ශක්තිමත් කිරීම.

### දූෂණයේ බලපෑම තේරුම් ගැනීම

වඩා අනතුරට භාජනය වියහැකි හෝ උපයෝජනයට ලක්විය හැකි අංශ හොඳින් තේරුම් ගැනීම පිණිස, ප්‍රධාන ප්‍රවනතා සහ ප්‍රශ්න ගැනත්, පද්ධති සහ ක්‍රියාවලි වැඩිදියුණු කරගැනීමට ඇති අවස්ථා ඉස්මතු කරගැනීමට සුදුසු අනෙකුත් ව්‍යාපෘති ගැනත් අපි පර්යේෂණ පවත්වන්නෙමු.

මෙම පර්යේෂණ අපේ විභාග සඳහා උපකාර වන අතරම, පහත සඳහන් දේ පිණිසද ඒවා භාවිතා කරණු ලැබේ:

- දූෂණය සහ එහි හානි ගැන අවබෝධය වැඩි කිරීම පිණිස, ප්‍රජාව සහ රාජ්‍ය අංශය සමග සම්බන්ධ වීම
- දූෂණ වාර්තා කිරීම වැඩිදියුණු කිරීම සහ පැමිණිලි ගැන කටයුතු කිරීමට රාජ්‍ය අංශයට ඇති ශක්තිය වර්ධනය කිරීම
- දූෂණ අවදානමට ඉදිරියෙන් සිටීම සඳහා ආයතන වලට අලුත්ම තොරතුරු සහ බුද්ධිය ගැන අනතුරු ඇඟවීම් කිරීම.

Level 1 North Tower
459 Collins Street
Melbourne VIC 3000
GPO Box 24234
Melbourne VIC 3001

දුරකථන 1300 735 135
ෆැක්ස් (03) 8635 6444

ජනවාරි 2017

IBAC රාජ්‍ය අංශයේ දූෂිත ක්‍රියා සහ පොලිසියේ අවකල්ක්‍රියා වැලැක්වීමේ සහ එළිදරව් කිරීමේ වගකීම පැවරුණ වික්ටෝරියාවේ දූෂණ විරෝධී ආයතනයයි. අප මෙම කාර්යය කරන්නේ පහත ආකාරයටය:

- බරපතල දූෂිත ක්‍රියා සහ පොලීසියේ අවකල්ක්‍රියා විභාග කිරීම
- දූෂිත ක්‍රියා සහ පොලීසියේ අවකල්ක්‍රියා වල අවදානම් සහ ප්‍රතිඵල ගැන සහ ඒවා වළක්වා ගැනීමට ඇති මාර්ග ගැන රාජ්‍ය අංශය, පොලිසිය සහ ප්‍රජාවට දැනුම් දීම

දූෂිත ක්‍රියා ගැන පැමිණිලි කල හැකි අන්දම ගැන සොයා ගැනීමට පිවිසෙන්න **www.ibac.vic.gov.au** හෝ මේ අංකයඅමතන්න **1300 735 135**.

ඔබට පරිවර්තන උපකාර අවශ්‍යනම් මේ අංකය ඔස්සේ පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවය අමතන්න **13 14 50** නැතහොත් මේ වෙබ් අඩවියට පිවිසෙන්න **www.ibac.vic.gov.au/general/accessibility/tr**

*මෙම පත්‍රිකාව තොරතුරු සඳහා පමණක් වන අතර එය නීති උපදෙස් සඳහා ආදේශනයක් ලෙස සැළකිය යුතු නොවේ.*